# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2392/46 - 2024 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2024.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/2013 (II)

**(454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත**

(454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 8 වන සහ 22 වන වගන්ති සමග කියවිය යුතු එකී ආඥාපනතේ 95 වන සහ 96 වන වගන්ති යටතේ සංචාරක සහ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලද සහ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

**නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු,**
සංචාරක සහ ඉඩම් අමාත්‍ය.

2024 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1948 ඔක්තෝබර් මස 15 වැනි දින අංක 9912 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1948 රජයේ ඉඩම් නියෝග, පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 4 වන නියෝගයේ (1) වන අනුනියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුනියෝග ආදේශ කිරීමෙන් :-

"(1) ආඥාපනතේ 22 වන වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු කාලසීමාව අවුරුදු පනහක් විය යුතුය:

එසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආයෝජන ව්‍යාපෘතිවල වාණිජ සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩමක් බදු දීමේ කාලසීමාව අවුරුදු අනූනවයක් විය යුතු ය. එම බදු දීම සඳහා වන බද්ද සෑම වසර පහකට වරක්ම සියයට විස්සක අනුප්‍රමාණයකින් ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය."; සහ

(2) 2023 නොවැම්බර් මස 23 වන දින අංක 2359/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ රජයේ ඉඩම් නියෝගවලට කරන ලද සංශෝධන මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ:-

EOG 07 - 0108

1A - G 42216 — 05 (2024/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*